**තොරතුරු හා තාක්ෂණවේදය (I T) සිග්‍රයෙන් වැඩී යන ප්‍රබල කාර්මික අංශයකි**

I T වෘත්තිමය ශිල්පීන් සඳහා ඉල්ලුම ලොව පුරා නොසිතූ විරූ අයුරින් දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. ලොව වටා රැකියා අවස්ථා හා විකල්ප රැකියාවන් බිහි කරමින් ඉතාම සිත් ඇදගන්නා සුලු ජීවනෝපායක් බවට එය පත්වෙමින් තිබේ. පසුගිය තුන් වසර තුළ ශ්‍රී ලංකාවේ I T කර්මාන්තයට ඇතුළත් වූ අයගේ සංඛ්‍යාව සියයට විස්සකින් ඉහළ ගොස් ඇත. දිනෙන් දින ලොව පුරා වැඩිවෙමින් පවත්නා I T සේවාවන් ගැන බලන විට ඉදිරි වසර වලදී ඉතාම ආකර්ශණීය වූ හා ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකිවන වෘත්තීය ක්‍රම බිහි කරන්නක් ලෙස I T කර්මාන්තය පවතිනු ඇත. ජීවනෝපායක් හැටියට උසස් දියුණුවක් ලැබීමට හා ස්වයං වර්ධනයක් ලැබීමට මෙන්ම මූල්‍යමය ප්‍රතිලාභ අත්කරගැනීමටත් I T ව්‍යාපාරය සලසන අව-ස්ථාවන් ඉතා විශිෂ්ටය.

**I T ජීවනෝපායක් ලෙසින් තෝරාගත යුත්තේ ඇයි?**

**ලොව මුළුල්ලේ ඊට ඇති ඉල්ලුම**

I T ශිල්පය හදාරා ලත් සුදුසුකමක් හා එහි පලපුරුද්ද ලොව ඕනෑම දිසාවක එක හා සමානව පිළිගනු ලබයි. I T උපාධියක් හිමිකරුවකු ලොව මුළුල්ලේම පිළිගනු ලබන ප්‍රමිතියක් ඇතිව සිටින්නෙකි. එම රැකියාවක් සඳහා උපාධිය කුමන රටකින් පිරිනැමුවේද යන්න ප්‍රශ්නයක් නොවේ. I T උපාධිය ලොව ඉහළ ප්‍රමිතියක් ය යනු පිළිගැනෙන බැවිනි. එහෙයින් එවැන්නෙකුට ලොව ඕනෑම තැනක සිය ජීවිකාව කරගෙන යා හැකිය. වෙනත් රටක් කරා පදිංචියට යන්නේ නම්, ඒ රටට ගැළපෙන රීතීන් හෝ අවශ්‍යතා අනුකූලව ඔබේ ශිල්පීය දක්ෂතාවයන් පෙන්වීමට අලුතින් සහතික හදාගැන්ම ඕනෑ නොකෙරේ.

යුරෝපීය, උතුරු අමෙරිකා හා ඕස්ට්‍රේලියාවේ සංවර්ධිත රටවල හා ප්‍රදේශයන් හි I T වෘත්තිකයන්ගේ තදබල හිඟයක් පැන නැගී ඇත. පදිංචිය සඳහා විදේශගත වීමට ඔබ සිතුවේ නම්, I T ක්‍රමවේදය ඊට හොඳම මාර්ගය වනු ඇත. පළපුරුදු I T වෘත්තිකයන් සිය ස්ථිර පදිංචිකරුවන් ලෙස භාරගැනීමට බ්‍රිතාන්‍යය (UK), ඕස්ට්‍රේලියාව හා කැනඩාව වැනි රටවල් දැඩි සේ උත්සාහ ගනී. ඒ සඳහා විශේෂිත වීසා බලපත්‍ර නිකුත් කිරීමක් ද කරනු ඇත.

**ඉහළම මූල්‍ය ප්‍රතිලාභ**

ආරම්භක අවස්ථාවේම හොඳින් මුදල් උපයාගත හැකි ව්‍යාපාර කිහිපයෙන් I T ක්‍රමවේදය ද එකකි. I T උපාධියක් හෝ සමාන සුදුසුකමක් ඇත්නම් මසකට රු. 15,000 සිට 30,000 දක්වා මුදලක් රැකියාවට පිවිසි තැන් සිටම උපයාගත හැකිවනු ඇත. ඔබ තවදුරටත් අත්දැකීම් ලබන විට හා සමත්කම් විදහා පාන විට සීග්‍ර අනුලාතයකින් යුතුව ඔබේ වේතනය වැඩි යනු ඇත. වසර 5 ක සම්පූර්ණ අත්දැකීම් සහිතව මසකට රු. 100,000 ක වේතනයක් ඉපයීම අසාමාන්‍ය සිද්ධියක් නොවන්නේය.

**වෘත්තියේ ඉදිරි ගමන හා ස්වයං වර්ධනය**

බොහෝ I T ව්‍යාපාර ක්‍රියාත්මක වනුයේ ජාත්‍යන්තර ගනුදෙනුකාර පිරිසක් හා සමඟය. එබැවින් I T වෘත්තිකයෝ පෘථිවි ගෝලයේ වැඩ කරන පරිසරයන්ට විවෘත වී සිය නිපුනතා විදහා දක්වන අවස්ථා ලබති. එය ඔවුනට තවදුරටත් ඉගෙනීමට හා ඉදිරියට යාම සඳහා උපකාරී වේ. ඔවුන් අයත් ව්‍යාපාරික සමාගම් ද සේවකයන්ගේ පුහුණුවීම හා වැඩි දියුණුව සඳහා දැඩි සේ ආයෝජනය කිරීමට ඉදිරිපත් වී ඇත.

I T ක්ෂේත්‍රයේ නිරන්තර ඉදිරි ගමන සමඟ පෙනෙන්ට ඇති කරුණ නම්, සෑම අලුත් දිනකම අලුත් යමක් එහි සිද්ධ වන බවය.

තෝරා ගැනීමට ඇති ක්ෂේත්‍රයන් ඉමහත්ය, පුළුල්ය.

මෘදුකාංග සංවර්ධනය, ව්‍යාපෘතීන් පරිපාලනය, පරීක්ෂණ සිදුකිරීම හා අනර්ඝත්වය තහවුරු කිරීම, ව්‍යාපාර දත්ත විග්‍රහය, ගනුදෙනුකාර/ අනුග්‍රාහක පාලනය, ව්‍යාපාර ජාලයේ/ පද්ධතීන් පාලනය, වෙබ් අඩවිය සංවර්ධනය, තාක්ෂණ සහය, පරිගණක දත්ත ගබඩාව පාලනය සහ තව බොහෝ මාර්ගයන් රැසකි. එකිනෙකට වෙනස් මේ ක්ෂේත්‍රයන් ඔස්සේ සැරිසැරීම ඉතා පහසුය. එසේ කිරීමෙන් වෘත්තිකයන්ට සිය ස්ථානයෙන් මාරු වෙමින් වැඩිපුර අත්දැකීම් එක්කර ගත හැකිය.

**ආරම්භ කරන්නේ කෙසේද?**

පාසැල් දිවිය නිම කළ අයකු ලෙස ඔබ I T ක්ෂේත්‍රයට ඇතුලු වීම සඳහා ගත යුතු මාර්ග ගණනාවකි.

*ඇතුළත්වීමේදී ම රැකියා:*

කෙටි පුහුණුවකින් පසු ආරම්භ කළ හැකි රැකියාවන් කිහිපයකි. අවශ්‍ය වන්නේ මූලික පුහුණුවකුත් සමඟ නිපුණත්වයක් පමණි. කෙසේවුවද, මෙය ව්‍යුහගත නොවන මාර්ගයක් බැවින් සාර්ථක වීම රඳා පවතිනුයේ, කෙතරම් වේගයෙන් අලුතෙන් යමක් ඔබට ඉගෙනගත හැකිද යන්න මත හා ඔබ සේවය කරන ව්‍යාපාරික සමාගමට ඔබෙන් ඉටුවිය යුතු මෙහෙය හරියාකාරයෙන් ඉටු වන්නේ ද යන්නත් මත ය.

ඔබ දක්ෂ පරිගණක රචකයෙකු නම්, හෝ දක්ෂ නිර්මාණ ශිල්පියෙකු නම්, පරිගණකය හා බැඳි මූලික ශිල්පීය ක්‍රම දන්නේ නම්, මෙම කර්මාන්තයට සම්බන්ධ රැකියාවන් විවෘතව ඇත. තාක්ෂණික රචනය හා වෙබ් අඩවි නිර්මාණය මෙම කර්මාන්තයට ඇතුළු වීමේදීම කළ හැකි රැකියාවන් වේ. ඒ කෙසේ වෙතත්, ඇතැමෙක් විශේෂිත පුහුණු දැනුම අවශ්‍ය වන I T ක්ෂේත්‍ර වලින් සිය දියුණුව සොයා ගන්නා අතර, ඇතැමෙකු සිය දියුණු වීමේ අවස්ථාවන් සීමා කරගන්නේ තමන්ට තිබිය යුතු අවශ්‍යතම සුදුසුකම නොමැති වීම හේතුවෙන්ය.

**වෘත්තිමය පුහුණුව**

I T කාර්මික ලොවට ඇතුලු වීමට හොඳ පදනමක් සකස් කරදෙන වෘත්තීය පුහුණු වැඩසටහන් කීපයක්ම ඇත. මේවායින් බොහෝ ජනප්‍රිය ඒවා නම්, බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) විභාගයන් ද ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ (ACS) විභාගයන් ද ව්‍යාපාර කළමනාකාරිත්ව ජාතික ආයතනයේ (NIBM) ඩිප්ලෝමා පරීක්ෂණයන් ද සඳහා වන පාඨමාලාවන් වේ. I T ක්ෂේත්‍රයේ නිවැරදි ආරම්භයක් ගැනීමට මේවා බොහෝවිට උසස් දැනුමක් හා නිපුණත්වයක් අත්කර දෙයි. එසේම, CSI සහතික ලාභී පරීක්ෂණ ඉංජිනේරු (CSTE) වැඩසටහන් අමෙරිකාවේ Quality Assurance Institute (QAI) මගින් පවත්වන ඉංජිනේරු පාඨමාලාව ද ජනප්‍රියත්වයක් දිනාගත්තක් වන අතර මෘදුකාංග පරීක්ෂණ කාර්යයේ රැකියාවකට පිවිසීම සඳහා හොඳ මාර්ගයක් වනු ඇත.

**I T උපාධියක්**

I T ක්ෂේත්‍රයට පිවිසීම සඳහා නොවරදින මාර්ගයක් නම්, එහි උපාධිය සඳහා පාඨමාලාවක් හැදෑරීමයි. බොහෝ ව්‍යාපාර වල හාම්පුතුන් I T ශිල්පීන් අන්තර්ජාතිකව සොයමින් සිටින්නේ මූලික වශයෙන් උපාධියක් තිබීම පිළිගත හැකි ප්‍රමිතියක් ලෙස සලකමිනි. I T උපාධි

පාඨමාලාව පූර්ණ කාලීනව හෝ කොටස් වශයෙන් හැදෑරිය හැකිය. උපාධියක් සඳහා පාඨමාලාවක් අරඹන විට සලකා බැලිය යුතු විකල්පයන් පහත දක්වා ඇත.

**I T උපාධිය ජාතික විශ්ව විද්‍යාල මගින් හැදෑරීම**

ජාතික විශ්ව විද්‍යාලයන්හි පවත්වාගෙන යන පරිගණක පාඨමාලාවක් සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් ඒ සඳහා පෞද්ගලිකව අයදුම් කළ හැකිය. බොහෝ ජාතික විශ්ව විද්‍යාල වත්මනෙහි I T උපාධිය සඳහා පාඨමාලා සම්පාදනය කරනු ලැබේ.

මෙම වැඩසටහන් ලැයිස්තු සඳහා www.ITpro.lk. බලන්න.

**I T උපාධිය පෞද්ගලික විද්‍යාල වල හැදෑරීම**

I T උපාධිය සඳහා අනර්ඝත්වයක් ඇති අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරන පෞද්ගලික ආයතක ගණනාවක් දැනට ඇත. මෙයින් බොහොමයක් විදේශිය විශ්ව විද්‍යාල හා සම්බන්ධිතව උපාධිය පිරිනමනු ලැබේ. ඒ අනුබද්ධිත විශ්ව විද්‍යාලයේ විෂය මාලාවට අනුකූලව පුහුණුව ලබාදෙනු ඇත. බොහෝ වැඩසටහන් වල කාලසීමාව වසර 3-4 දක්වා වේ. උපාධිය සඳහා වන පාඨමාලාවේ නිම කෙරෙන ඒ ඒ පියවරයන්හිදී ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත. මෙම වැඩසටහන් ලැයිස්තු සඳහා www.ITpro.lk. බලන්න.

**I T උපාධිය SLIIT, ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ ශිල්පීය ආයතනය මගින් හැදෑරීම**

SLIIT ආයතනය ශ්‍රී ලංකාව තුළ I T අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා පිහිටුවූවකි. ලාභ නොලබන ආයතනයක් වන මෙය I T උපාධිය සඳහා අපේක්ෂකයන් විශාල සංඛ්‍යාවක් ඇතුළත් කරගනිමින් සේවා සපයන අතර මාළඹේ පෙදෙසේ සිය ආයතනික පරිසරය තුළ පිහිටුවා ඇත.

SLIIT ආයතනය ශ්‍රී ලංකාව තුළ I T උපාධියකට හිමිකරුවකු වීම සඳහා අධික මිලක් වැය කිරීමට සිදු නොවන ආයතන වලින් එකකි. ඉගෙනුමේ කටයුතු කරන අතරතුරම රැකියාවක් කළ හැකි පරිදි SLIIT උපාධිය සඳහා අධ්‍යයන කටයුතු අර්ධකාලීන වශයෙන් පිළියෙල කරගත හැකිය.

## I T උපාධිය බාහිර වශයෙන් හැදෑරීම

බාහිර උපාධියට ඉගෙනීම බොහෝකොට තමාම වෙහෙසී කළ යුත්තකි. දෙන ලද සාධාරණ කාල සීමාව ඇතුළත නිම කළ යුතු හෙයින් තමා ගැනම ඉහළ මට්ටමේ ස්වයං පාලනයක් තබා ගත යුතු වේ. මෙවැනි බාහිර වැඩසටහනක ඇති එක් වාසියක් නම්, ඉගෙනුම ලබන අතරම ආරම්භක රැකියාවක් ද කළ හැකි වීමය. මූලික සුදුසුකම් හා නිපුණතා සහිතව අර්ධ කාලීන උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී සිටින අයවලුන් බොහෝ සමාගම් මගින් සිය ආධුනිකත්ව සේවාවන් සහ රැකියාවට පුහුණු කිරීම් සඳහාත් බඳවා ගනු ඇත.

## BIT උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයේ හැදෑරීම

මෙය කොළඹ විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවන බාහිර උපාධි වැඩසටහනකි. අදාළ විෂය මාලාව ඔවුන් සම්පාදනය කර ඇති අතර රූපවාහිනී සේවා මගින් සිය දේශන මාලාවන් විසුරුවා හැර අවසානයේදී විභාගයන් පවත්වනු ලබයි. BIT වැඩසටහනට අදාළ විෂය මාලාව බොහෝ ආයතන මගින් ඉගැන්වේ. කොළඹ විශ්ව විද්‍යාලයේ BIT වැඩසටහන සඳහා ලියාපදිංචි වී පෞද්ගලික ආයතනයක අදාළ විෂයන් ඉගෙනීම සිදුකළ හැකිය.

## විවෘත විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලය I T පාඨමාලා ගණනාවක් සපයා ඇත. විවෘත විශ්ව විද්‍යාලයීය පාඨමාලාව සකසා ඇත්තේ දුරස්ථ අධ්‍යයනය පිණිසය. එහි විෂය මාලාව ද පාඨමාලා සම්බන්ධ ද්‍රව්‍ය හා උපකරණ ද I T අධ්‍යයන ශිෂ්‍යයන් හට උපකාරී වීම සඳහා සමහර වැඩමුළු ද විශ්ව විද්‍යාලය මගින් සපයා දෙනු ලබයි. ඇතුළත් වීමේදී සඳහන් කෙරුණු සුදුසුකම් මත ඕනෑම අයකු හට විවෘත විශ්ව විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරීම සඳහා කිසිදු බාධාවකින් තොරව එහි ලියාපදිංචි වීමට අවකාශ ඇත. I T වේදය හෝ විද්‍යාව හෝ උසස් ගණිතය පිළිබඳ පූර්ව දැනුමක් නොමැති අයට විවෘත විශ්ව විද්‍යාලයේ පදනම් පාඨමාලා පවත්වාගෙන යයි. මෙය I T උපාධිය ඉලක්ක කළ පාඨමාලා / වැඩසටහන් සඳහා ද හොඳ ආරම්භයක් දීමට උපකාරී වනු ඇත. පිළියෙල කළ හරවත් පාඩම් අන්තර්ජාලය ඔස්සේ ද ශිෂ්‍යයනට පහසුවෙන් ලබාගත හැකි ලෙස දැනට විධිවිධාන යොදා ගෙන යනු ලබයි.

## විදේශීය උපාධියක් හැදෑරීම

ලොව වටා බොහෝ විශ්ව විද්‍යාල මගින් I T උපාධීන් ගණනාවක් සඳහා පාඨමාලා සපයා ඇත්තේය. ඒවා අතර කීර්තිනාමය අතින් ද වැඩසටහන් වල අනර්ඝතාවය අතින් ද ඇමරිකා

එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය (UK) ප්‍රමුඛස්ථානය ගනිති. ඉගෙනීම ජීවිත මාර්ගය වෙනස් කරන අත්දැකීමකි. ඇමරිකා එක්සත් ජනපදය හෝ එක්සත් රාජධානිය වැනි රටකින් ලද සුදුසුකමක් මත ලබාගත් රැකියාවකින් ප්‍රමුඛ ආර්භයක් ලැබිය හැකිය. කෙසේවෙතත් මෙය ශ්‍රී ලංකාවේ අධ්‍යයනයට වඩා වියදම් අධික කාර්යයක් වනු ඇත.

ඉන්දියාව I T පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා සාපේක්ෂව අඩු වියදම් සහිත විකල්පයන් සපයන්නේය.

**ඔබගේ උපාධිය සඳහා මූල්‍ය ආධාර**

I T අධ්‍යාපනය මහත් ආදායම් ගෙන එන සඵලවත් ආයෝජනයකි. මෑතක සිට බොහෝ බැංකු දේශීය මෙන්ම විදේශගත අධ්‍යාපනය ලැබීම සඳහා අධ්‍යාපනික ණය ක්‍රම ආරම්භ කර ඇත. කීර්තිමත් උපාධියක් සඵලවත් ලෙස නිමාකර විශාල ආදායම් ඉපයීම අපේක්ෂා කරමින් ඔබේ අධ්‍යාපනික කටයුතු වලට බැංකුවකින් ණය ආධාර සපයාගෙන මූල්‍යමය පිටුබලයක් ගැනීම ආකර්ශනීය මෙන්ම යෝග්‍ය වූද යෝජනාවක් වනු ඇත.

**වැඩකරමින් ඉගෙනීමෙහිත් යෙදී සිටීම**

ඉගෙනීමට ඇතුලු වෙද්දීම කළ හැකි රැකියාවක් නැත. වෙබ් අඩවි නිර්මාණය, තාක්ෂණික රචනය, පරීක්ෂා කිරීම, පරිගණක උදව් සැපයීම ආදිය ඒ අතර වේ. මේ සඳහා උපාධිය මට්ටමින් සුදුසුකම් අවශ්‍ය නොවේ. වැඩ කරමින්ම ඉගෙනීමෙහිත් යෙදීම I T ඇසුරින් රැකියාවකුත් දිගටම කරගෙන යාමට හොඳ විකල්පයක් සපයයි.

අර්ධකාලීනව ඉගෙනීමට ඉඩ සලසන ආයතනයක් ඇසුරෙන් ඔබට I T උපාධි වැඩසටහනක් සඳහා (ඉගෙනීම) ආරම්භ කළ හැකිය. එසේ වූ විට, ප්‍රථම වසරේදී හෝ දෙකේදී I T මූලික නිපුණතාවක් ලැබිය හැකි වනු ඇත. මෙසේ ලබන නිපුණතාවන්ට වෘත්තිමය අතින් පසුව ඔබ ලබන සහතික පත්‍ර හිමිකම් වලට හොඳ පිටුබලයක් වන්නේය. වෘත්තිමය අංශයෙන් ඔබට ලැබිය හැකි සමත්කම් වන ජාවා, මයික්‍රොසොෆ්ට් ටෙස්ටිං හෝ වෙනත් ඕනෑම සහතික පතක් හොඳ රැකියාවක් සඳහා ඔබේ පිළිගැනීමක් ඇති කරනු නිසැකය.

I T පිළිබඳ ඉගෙනීමට ඔබ ඇතුළු වෙද්දීම රැකියාවක් ද අරඹන විට ඔබේ I T උපාධිය වැඩසටහන අර්ධකාලීනව සම්පූර්ණ කළ හැකිය. තම සේවකයන්ගේ දැනුම වර්ධනය ප්‍රිය කරන ව්‍යාපාර සමාගම් මගින් සේවකයකුට අර්ධකාලීනව ඉගෙනීමට අවකාශ සලසා දෙනු ඇත. මෙම විකල්ප කාර්යය මගින් කෙරෙනුයේ ඔබ උපාධිය හිමිකරගන්නා කාලය වන විට

ඉතා ප්‍රබල ලෙස වාණිජ අංශයේ අත්දැකීමක් ලබා ගැනීමේ වාසිය උදා කරගැන්මට හැකිවීම වේ. සමහර ව්‍යාපාරික සමාගම් ඔබේ උපාධි වැඩසටහනේ වියදම් වල කොටසක් දැරීමට ප්‍රමාද වුවද එකඟත්වයක් පළ කරනු ඇත. ඔබ එසේ වැඩ කරමින් ම ඉගෙනීමට තීරණය කළ විය රැකියාවේ වැඩ ද ඉගෙනීම ද යන දෙකම සාර්ථක ව කළ හැකි පරිදි සතියේ දවස් හතම බලක්ක කොට ඔබව මනා පාලනයකට යටත් කර තබාගැනීම දැඩි අවශ්‍යතාවයක් වනු ඇත.

I T පාඨමාලා සපයනු ලබන ආයතන පිළිබඳ තෙරතුරු සඳහාත් ඔබගේ ජීවනෝපාය සැබැඳි කරුණු ගැන අන්‍යයන්ගෙන් ලැබිය හැකි විශේෂිත උපදෙස් ලබා ගැනීම සඳහාත් www.ITpro.lk. වෙබ් අඩවිය ඔස්සේ බලන්න.

IT pro යනු තොරතුරු හා තාක්ෂණවේදය මගින් ශ්‍රී ලංකාවේ ජනතාවට ඇවැසි රැකියාවක් නිර්මාණය කිරීම සඳහා සමාජ හිතවාදී ලෙස ගොඩනැගූ විධිමත් ආයතනයකි.